# බර්නාඩ් ෂෝ ගේ ජාතිය

බර්නාඩ් ෂෝ විද්වතාගේ ජාතිය කුමක් වී ද? ඔහු ඉංගිරිසි ජනවර්ගයට අයත් නො වී ය. ජනවර්ගයක් ලෙස ගතහොත් ඔහු අයිරිෂ් විය. අයිරිෂ් වැසියකු ලෙස නිවැරදිව කිවහොත් උතුරු අයර්ලන්තයේ වාසය කළ අයකු ලෙස ඔහු අයත් වූයේ එක්සත් රාජධානියට (United Kingdom) ය. ඔහු අඩු තරමින් බ්‍රිතාන්‍යයටවත් අයත් නො වී ය. එයට හේතුව උතුරු අයර්ලන්තය බ්‍රිතාන්‍යයට අයත් නො වීම ය. බ්‍රිතාන්‍ය ලෙස නම් කෙරුණේ එංගලන්තය, වේල්සය හා ස්කොට්ලන්තය ය.

අද එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි එංගලන්තය හෝ බ්‍රිතාන්‍ය හෝ නියෝජනය නො වෙයි. එහි නියෝජනය වන්නේ එක්සත් රාජධානිය ය. වෙනත් වචනවලින් කිවහොත් රාජ්‍යයක් ලෙස පවතින්නේ එක්සත් රාජධානිය ය. ඇතැම් විටක බ්ලෙයාර් මහතා බ්‍රිතාන්‍ය අගමැති ලෙස හඳුන්වනු ලැබුව ද, නිවැරදි ව කිවහොත් ඔහු එක්සත් රාජධානියේ අගමැති වරයා ය. එක්සත් රාජධානියෙහි පාර්ලිමේන්තුව ඇත්තේ ලංඩනයේ ය. එයට වෙස්ට්මිනිස්ටර් පාර්ලිමේන්තුව යැයි ද කියනු ලැබෙයි. සුප්‍රසිද්ධ බිග් බෙන් ඔර්ලෝසුව ඇත්තේ මේ පාර්ලිමේන්තුව අසළ තේම්ස් ගඟේ ඉවුරෙහි ය.

වෙස්ට්මිනිස්ටර් පාර්ලිමේන්තුවට අමතර ව වේල්සයේ, ස්කොට්ලන්තයේ හා උතුරු අයර්ලන්තයේ මන්ත්‍රී සභා වෙයි. මේ ඇතැම් මන්ත්‍රී සභාවකට පාර්ලිමේන්තුව නම යොදා ගැණුන ද, ඒ එක් ප්‍රදේශයක්වත් ස්වාධීන රාජ්‍යයක් නො වෙයි. වෙස්ට්මිනිස්ටර් පාර්ලිමේන්තුවෙන් ඇතැම් බලතල ඒ ඒ සභාවට බෙදා දී ඇත. එහෙත් ඒ ඒ මන්ත්‍රණ සභාවට බෙදා දී ඇත්තේ එකම බලතල නො වෙයි. ඒ අතර එංගලන්තයට වෙන ම පාර්ලිමේන්තුවක් නැත. එංගලන්තයේ අදාළ සියළු කටයුතු කෙරෙන්නේ වෙස්ට්මිනිස්ටර් පාර්ලිමේන්තුවෙනි.

පැහැදිලිව ම එක්සත් රාජධානිය යනුවෙන් හැඳින්වෙන රාජ්‍යයේ ඇත්තේ අසමමිතික බලය බෙදීමකි. ඒ රාජ්‍යයට අමතරව අයර්ලන්තය නමින් හැඳින්වෙන ස්වෛරී රාජ්‍යයක් අයර්ලන්තයේ දකුණෙහි ඇති බව ද අමතක නොකළ යුතු ය. අයර්ලන්තය කතෝලික රටක් වන අතර එක්සත් රාජධානිය පොදුවේ හත්කළ ප්‍රොතෙස්තන්ත (Protestant) වෙයි. ඒ ඒ ප්‍රොතෙස්තාන්තිකයන් අතර වෙනස්කම් ඇති බව ද අමතක නොකළ යුතු ය. එහෙත් එක්සත් රාජධානියේ පොදු සංස්කෘතියක් ඇත. ඒ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය වෙයි. ඒ වැසියෝ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට අයත් වූවෝ වෙති.

අද තත්වය එසේ වුව ද බර්නාඩ් ෂෝ විද්වතාගේ කාලයෙහි දී ඒ එසේ නො වී ය. ඒ ආකාරයට බලය බෙදීම් ඒ දිනවල කෙරී තිබුණේ නැත. සියල්ල වෙස්ට්මිනිස්ටර් පාර්ලිමේන්තුවෙන් සිදු කෙරිණි. ඒ අරුතින් ගත්කල එක්සත් රාජධානිය ඒකීය රාජ්‍යයක් විය. අද ද ඇතැම් බලය බෙදීම් මැද වුව ද එක්සත් රාජධානිය ඒකීය රාජ්‍යයක් ලෙස සැලකෙයි. ඒ සන්ධීය හෝ අඩුම තරමින් ව්‍යාජ සන්ධීය (Pseudo Federal) හෝ රාජ්‍යයක් යැයි කිසිවෙක් නො කියති. සමස්ත එක්සත් රාජධානියට ම ඇත්තේ එක් ජාතික ගීයකි. එක් ජාතික කොඩියකි. මුළු රටට ම ඇත්තේ එක් අගමැතිවරයෙකි.

එක්සත් රාජධානිය යනු ඊනියා ජාතික රාජ්‍යයකි (Nation State). ඒ ජාතියක් වීමට පළමුව රාජ්‍යයක් විය. බටහිර සමාජයීය විද්‍යාවන්ට ජාතියක් නිර්වචනය කිරීමට වඩා රාජ්‍යයක් නිර්වචනය කිරීම පහසු ය. රාජ්‍යයකට අනිවාර්යයෙන් ම අවශ්‍ය වන්නේ භූමි ප්‍රදේශයක්, විධායකයක්, ව්‍යවස්ථාදායකයක් පමණ ය. අධිකරණය වෙනුවෙන් ආයතනයක් තිබීම අනිවාර්ය නොවුවත් රාජ්‍යයකට බොහෝ විට අධිකරණයක් ද වෙයි. ඇතැම් යුගවල විධායකය, ව්‍යවස්ථාදායකය හා අධිකරණය එකම ආයතනයක් විය. ඒ ආයතනය රජු විය. පැරණි යුගයෙහි රාජ්‍යයෙහි භූමි ප්‍රදේශය රජුගේ සිතැඟි අනුව වෙනස්කිරීමට හැකි විය.

අප කලින් සඳහන් කර ඇති පරිදි ජාතික රාජ්‍ය ඇතිවීමත් සමග මේ තත්වය වෙනස් විය. රාජ්‍යයෙහි දේශසීමා වෙනස් නොවූ බවක් ඉන් නො කියැවෙයි. යුද්ධ හා වෙනත් ක්‍රමවලින් (ඒකපාක්ෂික ව ස්වාධීන රාජ්‍යයක් බව ප්‍රකාශ

© Prof. Nalin De Silva

කිරීම, රාජ්‍ය කිහිපයක් එකතු වී සන්ධීය රාජ්‍යයක් බිහිකිරීම ආදී වශයෙන්) භූමි ප්‍රදේශ වෙනස්වීම්, රාජ්‍ය බිහිවීම් ආදිය කෙරෙයි. එහෙත් රජුගේ සිතැඟි පරිදි අභිමත ව ඒ සිදු නො වෙයි.

ජාතික රාජ්‍යයක් ඇතිවීමෙන් පසුව ඒ රාජ්‍යයෙහි වාසය කරන ජනතාවගෙන් ජාතිය සමන්විත වේ යැයි සලකනු ලැබිණි. එවිට ජාතිය යන්න ද්විතීයික, එසේත් නැත්නම් ව්‍යුත්පන්නිත (derived) සංකල්පයක් බවට පත්වෙයි. ප්‍රධාන සංකල්පය ජාතික රාජ්‍යය ය. එහි ජාතික යන විශේෂණය තිබුණ ද ඒ වැදගත් නො වෙයි. එහි දී අර්ථදැක්වෙන්නේ රාජ්‍යය යන්න ය. රාජ්‍යයෙහි මිනිසුන් හා ගැහැණුන් වාසය කළ ද, රාජ්‍යය අර්ථදැක්වෙන්නේ මිනිසුන් හා ගැහැණුන් ආශ්‍රයෙන් නොව ආයතන ආශ්‍රයෙනි. ආයතනවල රජු, අගමැති මැති ඇමතිවරුන් ආදීන් සාමාජිකයන් වන නමුත් එහි දී වැදගත්වන්නේ ආයතන මිස මිනිසුන් නො වෙයි.

මේ බටහිර සමාජයීය විද්‍යාවන්ගේ බංකොළොත්කම නිසා සිදුවන්නකි. බටහිර භෞතික විද්‍යාව පිටුපස නොන්ඩි ගසමින් යන බටහිර සමාජයීය විද්‍යාවන්ට ජාතිය යන්න වියුක්ත සංකල්පයක් ලෙස නිර්වචනය කිරීමට නොහැකි වී ඇත. ජාතියක් සමන්විත වන්නේ මූලික වශයෙන් ම මිනිසුන්ගෙන් හා ගැහැණුන්ගෙන් ය. ජාතියකට අයත් මිනිසුන් හා ගැහැණුන් කවුදැයි කිව නොහැකි බටහිර සමාජයීය විද්‍යා ඊනියා ජාතික රාජ්‍යය ඔස්සේ ඒ කරගැනීමට උත්සාහ දරති. මේ ඉතා ම බාල වැඩකි. ඒ බාල වැඩක් වුව ද එහි ලාබ නැත්තේ නො වේ.

බර්නාඩ් ෂෝ විද්වතාගේ ජාතිය කුමක් වී ද යන ප්‍රශ්නය අප නගන්නේ මේ සන්දර්භයෙහි ය. ඔහු එක්සත් රාජධානිය නම් ජාතික රාජ්‍යයේ පුරවැසියකු වීම හේතුවෙන් ඔහුගේ ජාතිය වූයේ එක්සත් රාජධානියේ නමින් වූ ජාතිය ය. එහෙත් ඉංගිරිසි, අයිරිෂ් ආදී වශයෙන් ඒ ජාතිය හැඳින්විය හැකි නො වෙයි. ඊනියා ජාතික රාජ්‍යය ඇතිවීමෙන් පසුව ලෝකයේ ජාතිය හඳුන්වන්නේ කෙසේ ද යන ප්‍රශ්නය ඇතැම් අවස්ථාවල දී මතුවෙයි. ඇමරිකන් එක්සත් ජනපද රාජ්‍යය යනුවෙන් ඊනියා ජාතික රාජ්‍යයක් හැඳින්විය හැකි ය. එහෙත් එහි පුරවැසියකුගේ ජාතිය කුමක් ද යන ප්‍රශ්නය ඇසුවහොත් එයට පැහැදිලි නිශ්චිත පිළිතුරක් දිය හැකි නො වෙයි.

එයට හේතුව බටහිරයන්ට ජාතික රාජ්‍යය යන්න ප්‍රධාන සංකල්පය වීමත් ජාතිය යන්න එහි ව්‍යුත්පන්නිත සංකල්පයක් වීමත් ය. බටහිරයන්ගේ ප්‍රධාන වෑයම වූයේ ඊනියා ජාතික රාජ්‍යය හඳුනාගැනීම ය. ජාතිය කුමක් දැයි හඳුනාගැනීම ද්විතීයික කටයුත්තක් විය. අද බටහිරයෝ මේ ප්‍රශ්නයෙන් ගොඩ ඒම සඳහාත් ක්‍රමයක් සකස් කරගෙන සිටිති. ඔවුහු දැන් කිසිවකුගෙන් තමන්ගේ ජාතිය කුමක් දැයි නො අසති. ඔවුන් දැන් ප්‍රශ්න කරන්නේ යමකුගේ පුරවැසිභාවය කුමක් ද යන්න මිස ජාතිය කුමක් ද කියා නො වෙයි.

එහි දී ද බටහිරයන්ට අවශ්‍ය පුරවැසිභාවය කුමක් ද යන්න දැනගැනීම නොව පුරවැසිභාවය ලබා ඇත්තේ කිනම් රටක ද යන්න දැනගැනීම ය. අද බටහිරයන්ගේ විවිධ ආකෘති පත්‍රවල, පුරවැසි භාවය කුමක් ද යනුවෙන් අසා ඇති තැන්වල විකල්ප ලෙස ඉදිරියට එන නම් ලැයිස්තුව ජාතීන්ගේ නාම ලේඛනයක් නොවන බව ඉතා පැහැදිලි ය. ඒ ලැයිස්තුවෙහි ඇත්තේ විවිධ රටවල නාම ලේඛනයකි. එවට පුරවැසිභාවය ලෙස සඳහන්කළ යුත්තේ රටේ නම ය. උදාහරණයක් ලෙස ගතහොත් අපට පුරවැසිභාවය ලෙස සඳහන්කිරීමට සිදුවන්නේ ශ්‍රී ලංකාව කියා මිස ශ්‍රී ලාංකික (Sri Lankan) කියා නො වෙයි.

මෙයින් පැහැදිලි වන්නේ බටහිරයන්ට ජාතිය යනු කුමක් ද යන්න නිර්වචනය කරගැනීමට නොහැකිවීමෙන් ඇති වී තිබෙන ගැටළුව ය. බර්නාඩ් ෂෝ විද්වතාගේ ජාතිය කුමක් වී ද කියා අද දවසේ ප්‍රශ්නයක් නොඇසීමට බටහිරයෝ වග බලාගනිති. ඒ වෙනුවට ඔවුන් අසන්නේ බර්නාඩ් ෂෝ විද්වතාගේ පුරවැසිභාවය තිබියේ කිනම් රාජ්‍යයක වී ද (රටක ද) යන්න ය. ඒ ප්‍රශ්නයට ඔවුහු එක්සත් රාජධානිය යනුවෙන් පිළිතුරක් දෙති. මෙයින් පෙන්නුම් කරන්නේ බටහිර සමාජයීය විද්‍යාවේ බංකොළොත්කම මිස අනෙකක් නො වෙයි.

ඒ කෙසේ වෙතත් බර්නාඩ් ෂෝ විද්වතා අයර්ලන්තයෙන් ඉවතට ගෙන එංගලන්තයේ ලන්ඩනයේ පදිංචි කරවීමට ඉංගිරිසිහු සමත්වූහ. ඉන් නොනැවතුණු ඉංගිරිසිහු එතුමා ලවා ඉංගිරිසියෙන් පොත් ලියවූහ. අයිරිෂ් බස පෝෂණය කරනු වෙනුවට එතුමා දැනුවත් ව හෝ නොදැනුවත් ව හෝ කෙළේ ඉංගිරිසි බස පෝෂණය කිරීම ය. එතුමා ඉංගිරිසි

© Prof. Nalin De Silva

බස හරිහැටි කතාකිරීමට, උච්චාරණය කිරීමට නොහැකිවීම පිළිබඳ ඉංගිරිසින්ට දොස් කීවේ ය. ඒ සම්බන්ධයෙන් නාට්‍ය ඇතුළු පොතපත ලියා පළ කෙළේ ය.

බර්නාඩ් ශෝ විද්වතාගේ පුරවැසිභාවය තිබූ රට කුමක් වුව ද අවසානයේ දී එතුමාට සිදුවූයේ ඉංගිරිසිකාරයකු මෙන් ජීවත්වීමට ය. ඇතැමුන් නොපිළිගත්ත ද ඉංගිරිසිහු ඔහු ඉංගිරිසි ජාතියට අවශෝෂණය කළහ. එහෙත් තවමත් ඉංගිරිසිහු බර්නාඩ් ශෝ විද්වතාගේ අයිරිෂ් ජන්මලාභය ගැන කතාකරති. ඔවුහු එමගින් මුළු ලොව ම රැවටීමට උත්සාහ කරති. ලෝකයේ ජීවත්වන ඊනියා  දැනකියාගත් උගත්තු ඉංගිරිසින්ගේ මේ ගැටයට හසුවෙති. ඔවුහු අඩු තරමින් ඒ ගැටයක් යන්න බවවත් නො දනිති.

බර්නාඩ් ශෝ විද්වතාගේ කෘතිවල ඇත්තේ අයිරිෂ් සංස්කෘතිය ද නැත්නම් ඉංගිරිසි සංස්කෘතිය ද යන්න ගැන හෝ ඒ කෘතිවලින් පිළිබිඹුවන සංස්කෘතිය කෙමෙන් අයිරිෂ් සංස්කෘතියෙන් ඉංගිරිසි සංස්කෘතියට හැරී තිබෙන ආකාරය පිළිබඳ ව ගවේෂණයක් කෙරී ඇත්දැයි මම නො දනිමි. ඒ කෙසේ වෙතත් එවැනි අධ්‍යයනයකින් ඉංගිරිසි සංස්කෘතික යටත්විජිතවාදය පිළිබඳ ව යම් අවබෝධයක් ලබාගත හැකි යැයි සිතමි. ආර්ථික හා දේශපාලන යටත්විජිතවාදයට වඩා සංස්කෘතික යටත්විජිතවාදය සියුම් ය. අපට ඇතැම් විට එවැනි සංස්කෘතික යටත්විජිතවාදයක් නැති බව පෙන්නුම්කිරීමට තරම් සූක්ෂමභාවයක් එහි වේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva